# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2329/35 - 2023 අප්‍රේල් මස 26 වැනි බදාදා - 2023.04.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාත් සභාවේ 2019 අංක 04 දරන වෙළඳ ස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රඥප්තිය

**රීති (වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීමේ ගාස්තු සංශෝධනය)**

දකුණු පළාත් සභාවේ 2019 අංක 04 දරන වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රඥප්තියෙහි 19 වගන්තිය යටතේ දකුණු පළාත් සභාවේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා ජලාපවහන, ආහාර සැපයුම් හා බෙදාහැරීම්, වෙළෙඳ සහ සමුපකාර සංවර්ධන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල, එකී පළාත් සභාව විසුරුවා ඇති හෙයින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඇ වගන්තියෙන් මා වෙත පැවරී ඇති අතර, එකී බලතල ප්‍රකාරව, දකුණු පළාත් ආණ්ඩුකාරවර විලියම් විජේසිංහ ගමගේ වන මම දකුණු පළාත් සභාවේ 2019 අංක 04 දරන වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රඥප්තියේ රීතිවලට අදාළ අංක 2143/58 - 2019 ඔක්තෝබර් මස 04 වැනි *සිකුරාදා ගැසට් පත්‍රයේ* 4 වගන්තියේ දැක්වෙන වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීමේ ගාස්තු ප්‍රමාණයන් පහත පරිදි සංශෝධනය කරමි. මෙම රීති සංශෝධනය *ගැසට් පත්‍රයේ* පළකරන දිනයේ සිට බලපැවැත්විය යුතු ය.

" 04. 2019 අංක 04 දරන දකුණු පළාතේ වෙළෙඳ ස්ථාන ලියාපදිංචි කිරීමේ ප්‍රඥප්තියේ 18(1) යටතේ, පහත සඳහන් එක් එක් කාර්යයන් උදෙසා සහතිකයක් හෝ ප්‍රකාශනයක් නිකුත් කිරීම වෙනුවෙන් ඊට අනුරූපීව දක්වා ඇති ප්‍රමාණයන් යටතේ වූ ගාස්තු අය කළ යුතු වෙයි.

මෙහි දී වෙළෙඳ ස්ථානය ලියාපදිංචි කිරීමේ දී ඉදිරිපත් කරන ප්‍රාග්ධනය හෝ පිරිවැටුම යන දෙකෙන් වැඩි අගය සැලකිල්ලට ගත යුතු ය.

| *කාර්යය* | *ගාස්තු ප්‍රමාණය* |
|---|---|
| 4.1 තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාර වෙළෙඳ ස්ථානයක් ලියාපදිංචි කර සහතිකයක් නිකුත් කිරීම සඳහා | |
| 1. රු. 500,000 ට හෝ ඊට වැඩි ව්‍යාපාර සඳහා | රුපියල් 4,000.00 |
| 2. රු 250,000 සිට රු. 499,999.00 දක්වා වූ ව්‍යාපාර සඳහා | රුපියල් 2,875.00 |
| 3. රු 100,000 සිට රු. 249,999.00 දක්වා වූ ව්‍යාපාර සඳහා | රුපියල් 1,725.00 |
| 4. රු 50,000 සිට රු. 99,999.00 දක්වා වූ ව්‍යාපාර සඳහා | රුපියල් 1,150.00 |
| 5. රු. 50,000 ට අඩු ව්‍යාපාර සඳහා | රුපියල් 575.00 |
| 4.2 5 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සංශෝධන ප්‍රකාශයක් නිකුත් කිරීම සඳහා ගාස්තු | |
| 1. රු. 250,000 ට හෝ ඊට වැඩි ව්‍යාපාර සඳහා | රුපියල් 1,150.00 |
| 2. රු 250,000 ට අඩු ව්‍යාපාර සඳහා | රුපියල් 865.00 |
| 4.3 ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඉල්ලුම්පත් ගාස්තු | |
| 1. රු. 250,000 ට හෝ ඊට වැඩි ව්‍යාපාර සඳහා | රුපියල් 575.00 |
| 2. රු 250,000 ට අඩු ව්‍යාපාර සඳහා | රුපියල් 290.00 |
| 4.4 ලියාපදිංචි කිරීමේ සහතික පිටපතක් ලබා ගැනීම සඳහා ගාස්තු | |
| 1. රු. 250,000 ට හෝ ඊට වැඩි ව්‍යාපාර සඳහා | රුපියල් 1,150.00 |
| 2. රු 250,000 ට අඩු ව්‍යාපාර සඳහා | රුපියල් 865.00 |

4.5 ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ප්‍රමාද ගාස්තු අය කිරීම:

ව්‍යාපාර නාම ලියාපදිංචිය ව්‍යාපාරය ආරම්භකර දින 30 ක් ඇතුළත ලියාපදිංචි කිරීම සඳහා මෙහි 2 වගන්තියේ දක්වා ඇති ආකෘති මඟින් ඉල්ලුම් කළ යුතු ය. එම දින 30 ක කාල සීමාව ඉකුත් වන අවස්ථාවල දී පහත පරිදි ප්‍රමාද ගාස්තු අය කළ යුතු ය.

දින 31 - දින 90 දක්වා ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ නියමිත ගාස්තුව හා ඊට අමතරව රු. 2,875 ක දඩ මුදලක් ප්‍රමාද ගාස්තු ලෙස අය කළ යුතු ය.

ව්‍යාපාරය ආරම්භ කර දින 91 ක් ගත වූ කිසිදු ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමට හිමිකම නොලැබේ.''

ආචාර්ය **විලියම් විජේසිංහ ගමගේ**,
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2023 අප්‍රේල් මස 10 වැනි දින,
ගාල්ලේ දී ය.

EOG 04 - 0182

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.